# 15 ඊමේල් යවමු

කල්හාර, මොනවා ද ප්‍රදීප් ලියලා තියෙන්නේ?

අපේ තොරතුරු අහලා තියෙනවා.

එයාලා පහුගිය නිවාඩුවට ආච්චිලාගේ ගෙදර ගියාලු.

මේ බලන්න ප්‍රදීප්ගේ ඊමේල් **ලිපිනය.**

එයා ඒක අපිට එවලා.

Pradheep2008@gmail.com

දැන් අපට පුළුවන්

ඊමේල් එකකින්

ප්‍රදීප්ට උත්තර යවන්න.



කල්හාර, ඔයා දන්නවාද ඊමේල් යවන හැටි?

ඔව්, ගිය සතියේ අලුත් සර් අපිට කියලා දුන්නේ.

ඉතින්, අපි ලියුමක් ලියලා ඒක ඊමේල් එකකින් යවමු.

එහෙනම් අපි ඉස්සෙල්ලම ලියුම ලියමු.



කල්හාර ගුණරත්න,
නො 50,
නුවර පාර,
කුරුණෑගල.
2015.03.15

ජය වේවා!

හිතාදර ප්‍රදීප්,

ඔයාගේ ලියුම ලැබුණා. මමත් මාලිංගත් ඔයාලාගේ තොරතුරු අහලා සතුටු වුණා. අපේ ගෙදර හැමෝ ම හොඳින් ඉන්නවා. අපිත් හැමදා ම පාසල් යනවා.

ගිය නිවාඩුවට අපි යාපනේ ගියා. එහේදි නාගදීපය, ඩෙල්ෆ් දූපත, පතුල නොපෙනෙන ළිඳ බලන්න ගියා. එන ගමන් නල්ලූර් කෝවිලටත් ගියා. යාපනේ හරි ම ලස්සනයි, ඒත් ටිකක් රස්නෙයි.

එන නිවාඩුවට ඔයාලා අපේ ගෙදර එන්න. නිවාඩු කාලේ අපි නුවරඑළියේ යනවා. අපට සෙල්ලම් කරන්නත් පුළුවන්. අදට නවතින්නම්. පිළිතුරු එවන්න. ගෙදර සියලු දෙනා ම මතක් කළා කියන්න. දෙවි පිහිටයි!

මෙයට,
මිතුරු,
කල්හාර.

## වචන මාලාව

| | |
|---|---|
| තොරතුරු | - தகவல் |
| ලිපිනය | - விலாசம் |
| පුළුවන් | - முடியும் |
| ඊමේල් | - மின்னஞ்சல் |
| අපේ ගෙදර | - எங்கள் வீடு |
| ඔයාලාගේ | - உங்களது/ உங்களுடைய |
| නිවාඩු කාලේ | - விடுமுறை காலத்தில் |
| සෙල්ලම් | - விளையாட்டு |
| එන්න | - வாருங்கள் |

සෙල්ලම් කරන්නත් පුළුවන් - விளையாட முடியும்

## ක්‍රියාකාරකම 01

**ලිපියක් ලිවීමේ දී යොදා ගන්නා ආශීර්වාද ඉදිරියේ ✓ ලකුණ යොදන්න.**
**கடிதம் எழுதும் போது பயன்படுத்தபடும் ஆசிர்வாத சொற்களுக்கு அருகில் ✓ அடையாளமிடுக.**

1. ජය වේවා! .................
2. ආදරණීය අම්මා .................
3. දෙවි පිහිටයි! .............
4. හිතවත් මිතුර ...........
5. සැප වේවා! ............
6. සුබ දවසක් වේවා! ...........
7. දයාබර මිතුරිය .............
8. සෙත් වේවා! ...............

## ක්‍රියාකාරකම 02

**නිවැරදිව ගළපා ලියමු.**

**ஒழுங்குபடுத்தி எழுதுவோம்**

1. ඔයාලාගේ සැපදුක් කෙසේ ද?

2. ජය වේවා!

3. කල්හාර ගුණරත්න,
   නො: 50,
   නුවර පාර,
   කුරුණෑගල.

4. මීට,
   මිතුරු,
   කල්හාර.

5. හිතාදර ප්‍රදීප්

......................................

......................................

......................................

......................................

......................................

......................................

......................................

.........................................................................................................

....................................

....................................

## ක්‍රියාකාරකම 03

ගළපමු. කියමු. ලියමු.
இணைப்போம், வாசிப்போம், எழுதுவோம்.

| | | |
|---|---|---|
| ඔයාලාගේ<br>කල්හාරගේ | අලුත් තොරතුරු<br>සැපදුක්<br>සැපසනීප | කෙසේ ද?<br>කොහොම ද? |
| අපි<br>හැමෝම | හොඳින්<br>සනීපෙන්<br>සතුටින් | ඉන්නවා |

## ක්‍රියාකාරකම 04

පාඩමෙන් වචන සොයා ලියමු. කියමු.
பாடத்தில் சொற்களைத்தேடி எழுதுவோம், வாசிப்போம்.

1. ඔයාලාගේ ....................................... කෙසේ ද?
2. .................................. හැමෝම හොඳින් ඉන්නවා.
3. ගිය නිවාඩුවට අපි ...................................... ගියා.
4. නිවාඩු කාලයේ අපි .................................... යනවා.
5. අපට .................................... කරන්නත් පුළුවන්.

## ක්‍රියාකාරකම 05

**පිළිතුරු ලියමු. කියවමු.**
**விடைகளை எழுதுவோம், வாசிப்போம்.**

1. ප්‍රදීප්ගේ ඊමේල් ලිපිනය කුමක් ද? ..................................
2. කල්හාරගේ ලිපිනය කුමක් ද? ..........................................
3. ටිකක් රස්නෙයි කීවේ කොහේ ද? ....................................
4. යාපනේ දී දකින්නට ලැබෙන තැන් තුනක් ලියන්න.

   ............................................

   ............................................

   ............................................

5. එන නිවාඩු කාලයේ යන්නේ කොහේ ද? .......................

## ක්‍රියාකාරකම 06

**කල්හාරට පිළිතුරු ලිපියක් ලියන්න.**
**கல்ஹாரவிற்கு பதில் கடிதம் எழுதுங்கள்.**